ගිරිබාව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 22 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා තිබුණු රු.151,000 ක් වටිනා ජල බවුසරය හා ජල මෝටරයේ වටිනාකම මෝටර් රථ හා කරත්ත යටතේ ඇතුළත්ව තිබීමෙන් එම ප්‍රමාණයෙන් මෝටර් රථ හා කරත්ත ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමේ ඇතුළත් යාය 03 පොළ ගොඩනැගිල්ල හා ඉඩමේ වටිනාකම රු.4,266,906 ක් වුවද, කඩා ඉවත් කර තිබුණු රු.582,100 ක ගොඩනැගිලි වටිනාකම ඉවත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් වැඩියෙන් ගිණුම්ගතව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කඩා ඉවත් කරන ලද රු.73,710 ක් වටිනා පෙරටු කාර්යාල ගොඩනැගිල්ලේ අගය ගොඩනැගිලි වටිනාකම තුළ ඇතුලත්ව තිබෙන බැවින් එම වටිනාකමින් ස්ථාවර වත්කම් වැඩියෙන් ගිණුම්ගතව තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර තිබුණු රු.2,836,958 ක් වටිනා පැරකුම් සතිපොලෙහි කඩකාමර වටිනාකම හා රු.2,053,658 ක පිරිවැය වූ හජ්ජිකුච්ජි රථගාලෙහි වටිනාකම ගිණුම්ගතව නොතිබීමෙන් එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් අඩුවෙන් ගිණුම්ගතව තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් වූ ඉඩම් 18 ක් හා ස්ථාවර වත්කම් ලේඛනයට ගෙන නොතිබුණු ඉඩම් කොටස් 46 ක් වශයෙන් වූ ඉඩම් 64 කට අදාල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනය අනුව වූ රු.60,000 ක් වටිනා ඉහල ගිරිබාව සහ තඹුත්ත සුසාන භූමි ගොඩනැගිලි වටිනාකම වූ රු.60,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඒවාට අදාල උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු.185,427 ක නොසැසඳීම් පැවතිණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 36,504,990 ක් වූ අතර, ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ රු.290,366 ක් වූ බදු කුලී වසර තුනකට අධික කාලයක සිට හිඟව පැවතුණ බැවින් ඒවා අයකර ගැනීමට මහව අධිකරණයේ නඩු පවරා තිබුණි.

#### (ආ) ගෙවිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 29,497,477 ක් වූ අතර, එයින් වසර 01 ට වැඩි වසර 03 ට අඩු රු.24,953,885 ක් හෙවත් සියයට 84 ක මුදලක් පැවතුණි. තවද එම මුදලින් සියයට 98.5 ක් පසුගිය වර්ෂවල සිදුකල කර්මාන්ත සඳහා ප්‍රතිපාදන නොලැබීම මත වූ ණයහිමි ශේෂයන් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.62,379 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,396,022 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,333,643 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.12,603,237 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.12,554,710 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රතිඵලය රු.110,906 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තථ්‍ය ආදායම, තථ්‍ය වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | | ආදායම | | | | වියදම | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | 2015 | 2014 | විචලනය |
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 3,828 | 2,736 | 1,092 | පෞද්ගලික පඩිනඩි | 25,575 | 18,186 | 7,389 |
| (ii) | වෙනත් | 28,655 | 23,650 | 5,005 | අනෙකුත් | 6,845 | 6,804 | 41 |
| | උප එකතුව | 32,483 | 26,386 | 6,097 | උප එකතුව | 32,420 | 24,990 | 7,430 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 12,603 | 25,527 | (12,924) | ප්‍රාග්ධන වියදම | 12,555 | 22,604 | (10,049) |
| | මුළු එකතුව | 45,086 | 51,913 | (6,827) | මුළු එකතුව | 44,975 | 47,594 | 2,619 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 62 | 1,396 | 1,334 | අතිරික්තය | 111 | 4,319 | 4,208 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.32,482,701 ක මුදලින් සියයට 88 ක් වූ රු.28,655,119 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි ලැබීම්වලින් සමන්විත විය.

(ඇ) ප්‍රාග්ධන ආදායම වූ රු.12,603,237 ක මුළු ප්‍රමාණයම ගම නැගුම, මග නැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.32,420,321 න් සියයට 79 ක් වූ රු.25,575,173 ක මුදලක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර, ඉන් සියයට 95 ක් වූ රු. 24,367,082 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර, එම වටිනාකම වැටුප් ප්‍රතිපූර්ණ යටතේ ගිණුම්ගත කර ද තිබුණි.

(ඉ) ප්‍රාග්ධන වියදම වූ රු.12,554,710 න් සියයට 10 ක් හෙවත් රු.1,267,945 ක් සභා අරමුදලින් වැය වී තිබූ අතර ඉතිරි සියයට 90 ක් වූ රු.11,286,765 ක ප්‍රමාණයම ගම නැගුම , මග නැගුම, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම සඳහා ලැබුණු පළාත් ආයෝජන වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් සිදුකළ සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

#### (අ) ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය ආදායම

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තු ගත | 2015 තත්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තු ගත | 2014 තත්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 10 | 305 | 358 | 305 | 305 | 342* |
| (ii) | බදුකුලී | 1,972 | 3,063 | - | 1,976 | 2,005 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 584 | 245 | 339 | 284 | 260 | - |
| (iv) | වෙනත් ආදායම් | 64,327 | 28,869 | 3,818 | 6,560 | 6,860 | 2,727* |
| | එකතුව | 66,893 | 32,482 | 4,515 | 9,125 | 9,430 | 3,069 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම | එකතුව | ආදායම් රැස් කිරීම: 2015/01/01 දක්වා හිඟයෙන් | ආදායම් රැස් කිරීම: බිල්කළ ආදායමින් | ආදායම් රැස් කිරීම: එකතුව | හිඟහිටි ශේෂය: 2015/01/01 දිනට පැවති හිඟයෙන් | හිඟහිටි ශේෂය: බිල්කළ ආදායමින් | හිඟහිටි ශේෂය: 2015/12/31 දිනට මුළු හිඟය (ගණනය කිරීම් අනුව) | 2015/12/31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | - | 10 | 10 | - | 305 | 305 | - | - | (295) | - |
| බදුකුලී | 338 | 1,972 | 2,310 | 25 | 3,063 | 3,088 | 312 | 46 | (779) | 358 |
| බලපත්‍ර ගාස්තු | - | 584 | 584 | - | 245 | 245 | - | 339 | 339 | 339 |
| වෙනත් ආදායම් | 4,606 | 64,327 | 68,933 | 4,225 | 28,869 | 33,094 | 479 | 3,339 | 35,937 | 3,818 |
| එකතුව | 4,944 | 66,893 | 71,837 | 4,250 | 32,482 | 36,732 | 791 | 3,724 | 35,202 | 4,515 |

* සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව ගණනය කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අවසන් ශේෂයන් සමඟ නොසැසඳුණි.

### 2.3.3 බදුකුලී

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල වාර්ෂික ටෙන්ඩර් මත වත්කම් 09 ක් රු.1,744,547 ක ටෙන්ඩර් මුදලකට ලබාදී තිබුණු අතර ඉන් සියයට 65 ක ටෙන්ඩර් වටිනාකම සහිත යාය 03 සතිපොල රු.1,144,000 කට බදුකරුවෙකුට ලබාදී තිබුණි. අදාල බදුකරු ජනවාරි සිට අප්‍රේල් දක්වාම බදු මුදල් නොගෙවීම මත බදු ගිවිසුමද අහෝසි වී තිබුණි. බදු ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකර රු.457,600 ක ගිවිසුම් ඇප මුදල හිඟ වාරික සඳහා හිලව් කරගෙන තිබුණු අතර තවදුරටත් ඔහුගෙන් රු.45,760 ක ප්‍රමාද ගාස්තුවක් සභාවට අයවීමට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට බදුකරුවන් 08 දෙනෙකුගෙන් වසර 03 සිට වසර 25 දක්වා කාලයක සිට පවතින රු.290,366 ක බදු මුදලක් අයවීමට තිබුණි.

### 2.3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති 40 ක් සඳහා විවිධ ප්‍රභවයන් මත 2014 වර්ෂයේ ලැබී තිබුණු රු.5,400,000 ක් වූ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) 2014 හා 2015 වර්ෂවල පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ පහල ගිරිබාව රෝහල ඉදිරිපිට සිට ගම්මානය දෙසට යන මාර්ගය පෙර සවි කොන්ක්‍රීට් බිම්ගල් අතුරා ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයය අංක 10 යටතේ මීටර් 0.12 ක් උසට උපදෙස් පරිදි II පන්තියේ ලෑලි භාවිතා කර මාර්ගය දෙපස කර්බ් සඳහා අවශ්‍ය හැඩයම් ගැසීමට 2015 සැප්තැම්බර් 09 දින රු.100,237 ක් ගෙවා තිබුණද, විවිධ ස්ථානවල උස මීටර් 0.09 සිට 0.0915 දක්වා වූ විචලනයන් පැවතිණි. හැඩයම් ගැසීම මෘදු නිමාවක් ඇතිවන පරිදි ලඹ කර මට්ටම් කර නියමිත උසට කාණු කපා සිදුකළ යුතු වුවද, එසේ සිදුකර නොතිබූ බව 2016 මාර්තු 01 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අනාවරණය විය. තවද නිසි ප්‍රමාණයට හැඩයම් නොගැසීම හා කාණු නොකැපීම මත කර්බ් කොන්ක්‍රීට් කිරීම සඳහා ගෙවන ලද රු.241,071 ක ප්‍රමාණයද භෞතික මිනුම් ගැනීමකින් තොරව සිදුකර තිබුණි.

(ඇ) පොතානේ වැව පෙර පාසැල් ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා 2014 වර්ෂයේ එක් ගමකට එක් වැඩක් වැඩ සටහන යටතේ රු.600,000 ක ඇස්තමේන්තුගත මුදලක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විට අඩි 8 ක් උස අහල් 9 කුළුණු 4 කට හා අත්තිවාරම් බිම් 4 කට පමණක් අදාල ඉදිකිරීම් සිදුකර කර්මාන්තය අතරමග නවතා දමා තිබුණු නමුත් ඒ වන විට රු.352,432 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන නගා සිටුවීම යටතේ රු.3,000,000 ක් වියදමින් ඉදිකළ හස්ති කුච්චි රථ ගාලෙහි වැසිකිළි පද්ධතියේ කාන්තා වැසිකිළියේ මුහුණ සෝදන බේසම සවිකර තිබුණු කොටසේ බිම ටයිල් කිරීම නිසි ප්‍රමිතියෙන් සිදුකර නොතිබීම හේතුවෙන් ගෙබිම මැද ජලය රැස්ව තිබුණි. ඉදිරිපස දොර වැසීමට නොහැකි අයුරින් දොර මැදින් පුපුරා ඇඹරී තිබුණි. මේ හේතුවෙන් යොදා තිබුණු පිත්තල සරනේරු හා යුනියන් වර්ගයේ දොර අගුලද නිශ්කාර්ය ලෙස විනාශ වෙමින් පැවතුණි. කාන්තා වැසිකිළියේ එක් වැසිකිළියක දොර සවිකළ දින සිටම වැසීමට නොහැකිව තිබුණු අතර බිඬේ ෂවර් එක හා සිස්ටන් එක සවිකළ දින සිටම භාවිතයට ගත නොහැකිව තිබුණි. තවද වැසිකිළිය ඉදිරිපස වහලයේ වඩිම්බුව සකස්

කිරීමේදී වඩිම්බු ලෑලි ගැසීමට  පෙර පරාල නිසි පරිදි නූලක් යොදා කපා මට්ටම් නොකර වඩිම්බු ලෑල්ල පරාල අසලින් කපා පරාල පිටතට පෙනෙන අයුරින් වඩිම්බු ගසා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වී සිටි සැපයුම්කරුවන් 07 දෙනෙකුගෙන් මිල ගණන් නොකැඳවා ලියාපදිංචි නොවූ වෙනත් ආයතනවලින් භාණ්ඩ මිලට ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 46 කදී ලියාපදිංචි නොවූ සැපයුම්කරුවෙකුගෙන් ඉදි කිරීම් සඳහා රු.1,704,772 ක ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ මිලටගෙන තිබුණි.

(ආ) 2013 මැයි 29 දින මුදල් අක්‍රමිකතාවයක් හේතුවෙන් සේවයෙන් පහකර තිබුණු ආදායම් පරිපාලකගේ ණය හා අත්තිකාරම් ශේෂය වූ රු.17,100 ක් ද, නිකවැරටිය  ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරු වී ගොස් 1993 අගෝස්තු 01 දින විශ්‍රාම ගිය නිලධාරීවරයෙකුගෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභාව අයකර තිබුණු රු.14,100 ක ණය හා අත්තිකාරම් මුදලද 1989 වර්ෂයට පෙර ගල්නෑව ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරු වී තිබුණු ආදායම් පරිපාලකගේ ආපදා ණය ශේෂය වූ රු.2,688 ක මුදලද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

ගිරිබාව කසල කළමණාකරන මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා පවරා නොගත් රජයේ ඉඩමක අක්කර 05 ක පමණ භූමියක මීටර් 202.35x100 දිගට හා පළලට වැටක් ඉදි කිරීමට සැලසුම් කර 2014 අගෝස්තු මාසයේදී ඉදි කිරීම් කර තිබුණු අතර 2016 මාර්තු 01 දින භෞතික පරීක්ෂාවේදී වැටකණු 276 න් 260 ක්ම ගැලවී බිම වැටී තිබුණු අතර කොන්ක්‍රීට් කණු සිටුවීමේදී පාදමට කොන්ක්‍රීට් දමා නොතිබුණි. කටු කම්බි පොටවල් 5 ක් පෙරළුනු වැටවටා ගසා තිබුණු අතර අඩි 200 ක පමණ ප්‍රදේශයක කටු කම්බි කපාගෙන ගොස් තිබුණි. කම්බි කණු 14 ක් කැඩී තිබුණි. සිදුවූ අලාභය ගණනය කර වගකිවයුත්තන්ගෙන් අයකරද නොතිබුණි. වැඩ විෂයය අංක 04 යටතේ 1:3:6 (40 mm) මිශ්‍රණයෙන් කම්බි කණු මුල කොන්ක්‍රීට් කර නොතිබියදීත් භෞතික ප්‍රගතිය සියයට සියයක් ලෙස සඳහන් කර රු.341,913 ක් 2014 සැප්තැම්බර් 24 දින ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටද ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. <u>යහපාලනය හා ගිණුම් කටයුතුභාවය</u>

### 4.1 <u>වත්කම් කළමනාකරණය</u>

<u>**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතව තිබුණු රු.2,175,445 ක් වූ වත්කම් 03 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල අටේ කණුව මහජන පුස්තකාලයට ජල පහසුකම් ලබාදීම සඳහා මිලට ගෙන තිබුණු රු.13,950 ක් වටිනා වතුර මෝටරයක් වගකීම් කාලයද අවසන් වී නිෂ්කාර්යව තිබුණි.

## 5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය